නිමැවුම් පදනම් ආධාර මත ගෝලීය හවුල්කරු (GPOBA) ව්‍යාපෘතිය - 2013

---

නිමැවුම් පදනම් ආධාර මත ගෝලීය හවුල්කරු (GPOBA) ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලං ර) සහ ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව (ප්‍රසංජාබැ) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජා සං ස) අතර 2011 දෙසැම්බර් 27 දින එළඹි අංක ටීඑෆ් 099870 දරන ප්‍රදාන ගිවිසුමේ 2.06 (ඇ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල්, යෙදවීම හා ව්‍යාපෘති කාලය

නිමැවුම් පදනම් ආධාර මත ගෝලීය හවුල්කරු (GPOBA) ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුමට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ ජලසම්පාදන හා ජලාපවහන සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, පවත්නා නිවාස මලාපවහන සම්බන්ධතා සංඛ්‍යාව හා නව මලාපවහන ජාලයන් වැඩිකිරීම සහ ගෘහස්ථ මට්ටමින් ආරම්භක සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීම මඟින් මහ කොළඹ ප්‍රදේශයේ අඩු ආදායම් නිවැසියන් සඳහා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමයි.

ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය එජඩො මිලියන 9.96 ක් වන අතර ඉන් එජඩො මිලියන 5.08 ක් හෙවත් සියයට 52 ක් මූල්‍යයනය කිරීම සඳහා ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. තවද එජඩො මිලියන 3.24 ක් හෙවත් සියයට 33 ක් සඳහා ශ්‍රී ලංකා රජය (ශ්‍රී ලං ර) දායක වන අතර එජඩො මිලියන 1.21 ක් හෙවත් සියයට 11 ක් සඳහා ජාතික ජලසම්පාදන හා ජලපවහන මණ්ඩලය දායක වේ. ඉතිරි එජඩො මිලියන 0.43 හෙවත් සියයට 4 සඳහා ප්‍රතිලාභීන් දායක වේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 දෙසැම්බර් මාසයේදී ආරම්භ කරන ලද අතර 2015 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන

පිළියෙල කිරීමේදි කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි.පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්,වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඇ) වියදම් නිවැරදිව හඳුනා ගෙන වර්ගීකරණය කර තිබුණේද යන බව.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව සහ

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව.

## 3. මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව, සහ

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

---------------

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.54,289,672 ක් හා ඉකුත් වර්ෂයේ වියදම රු.4,078,819 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.58,368,491 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| **විෂයය** | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** | | **2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම** |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| දේපල, පිරියත හා උපකරණ | 84,500 | 798,625 | 883,125 |

| | | | |
|---|---|---|---|
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | 54,205,172 | 3,280,194 | 57,485,366 |
| | --------------- | -------------- | -------------- |
| එකතුව | 54,289,672 | 4,078,819 | 58,368,491 |
| | ========= | ========= | ========= |

## 5. විගණන නිරීක්ෂණ

වයාපෘතියේ කාර්යයන්වලට අදාළ නොවන කටයුතු සඳහා රු.472,192 ක මුදලක් වැය කර තිබුණි.

## 6. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 6.1 අරමුදල් උපයෝජනය

ලැබුණු තොරතුරුවලට අනුව, අරමුදල් වෙන්කිරීම සහ 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | සැපයීම සඳහා එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | 2013 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් |
|---|---|---|---|---|---|
| | එ ජ ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ප්‍රදාන | 5.08 | 660.40 | 100 | - | - |
| ශ්‍රී ලං ර | 3.24 | 421.46 | 150 | 45.00 | 48.06 |
| ජා ජ ස ජ ම | 1.21 | 157.04 | 50 | 15.00 | 15.00 |
| ප්‍රතිලාභීන් | 0.43 | 55.90 | - | 5.15 | 5.15 |
| එකතුව | 9.96 | 1,294.80 | 300 | 65.15* | 68.21* |

* තැන්පතු හා අත්තිකාරම් උපයෝජනය කළ අරමුදල් ලෙස සැලකීම හේතුවෙන් මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන මුදල සමඟ මෙම මුදල එකඟ නොවේ.

### 6.2 භෞතික කාර්යසාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආරම්භක අදියරේදී සාවද්‍යාව ඇස්තමේන්තු කිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ ප්‍රධාන සැලැස්මේ ප්‍රතිලාභී නිවැසියන් 15,407 ක් සඳහා ඉලක්කගත ජල සැපයුම් සම්බන්ධතා පසුව ප්‍රතිලාභී නිවැසියන් 5,015 දක්වා අඩුකර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අයවැය ඇස්තමේන්තුවේ සලසන ලද රු.මිලියන 100 ක මුළු වෙන්කිරීමෙන් රු.මිලියන 75 ක මුදලක් ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන වෙනත් ව්‍යාපෘති සඳහා මාරුකර තිබුණි.

(ආ) ව්‍යාපෘති සංරචක 11 කින්, සංරචක 06 ක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.කෙසේ වුවද එම සංරචක ව්‍යාපෘතියේ ප්‍රධාන සැලැස්ම තුළ ඇතුළත් කර තිබුණි.

(ඇ) පූර්ණ කාලීනව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයකු පත්කිරීම සඳහා ප්‍රදාන ගිවිසුමේ තිබූ විධිවිධාන වලට පටහැනිව 2011 නොවැම්බර් සිට ව්‍යාපෘතිය සඳහා වැඩ බැලීමේ පදනම මත ව්‍යාපෘති කළමනාකරුවකු ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය විසින් පත්කර තිබුණි.

**6.3 නිශ්ඵල ගනුදෙනු**

-------------------

ව්‍යාපෘතියේ කිසිදු කාර්යයකට සම්බන්ධ නොවූ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවකයෙකුට රු.533,291 ක් වූ පාරිශ්‍රමික ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි.